274 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 274 - இல. 4
Volume 274 - No. 4

2019 සැප්තැම්බර් 06 වන සිකුරාදා
2019 செப்ரெம்பர் 06 வெள்ளிக்கிழமை
Friday, 06th September, 2019



# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන :**
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු නොදීම සම්බන්ධ මාධ්‍ය වාර්තා

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පලාලි ගුවන් තොටුපොළ සංවර්ධනයට අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි

**මුදල් පනත් කෙටුම්පත :**
පළමු වන වර කියවන ලදී.

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
வாய்மூல விடைக்கான வினாக்களுக்குப் பதிலளிக்காமை குறித்த ஊடக அறிக்கைகள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
பலாலி விமான நிலைய அபிவிருத்திக்காகச் சுவீகரிக்கப்பட்ட காணிகளுக்கான இழப்பீடு

**நிதிச் சட்டமூலம்:**
முதன் முறை மதிப்பிடப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Media Reports on Non-response to Questions for Oral Answers

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Compensation for Lands Acquired for Development of Palaly Airport

FINANCE BILL:
Read the First time

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2019 සැප්තැම්බර් 06වන සිකුරාදා***
*2019 செப்ரெம்பர் 06 வெள்ளிக்கிழமை*
*Friday, 06th September, 2019*

**පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු නොදීම සම්බන්ධ මාධ්‍ය වාර්තා
### வாய்மூல விடைக்கான வினாக்களுக்குப் பதிலளிக்காமை குறித்த ஊடக அறிக்கைகள்
### MEDIA REPORTS ON NON-RESPONSE TO QUESTIONS FOR ORAL ANSWERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ඊයේ පාර්ලිමේන්තු සභා ගර්භයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසන ලද වාචික ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට ගරු අමාත්‍යවරුන් නොපැමිණීම සම්බන්ධයෙන් අද දින මුද්‍රිත මාධ්‍යවල පළ වූ වාර්තා පාර්ලිමේන්තුවේ කීර්තිනාමයට ඉතාම හානිකර බව සඳහන් කරන්නේ බලවත් කනගාටුවෙනි.

මේ ගැන ඊයේ සභා ගර්භයේදීම පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා විසින්ද කරුණු පැහැදිලි කරන ලදී. අවසානයේදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කර, එකඟතාවකට පැමිණීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන ගියද, මෙවැනි අවස්ථා ඉදිරියේදී ඇති නොවීමට පියවර ගැනීම ආණ්ඩුවේ වගකීමක් බවත්, එවැනි අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විනයගරුකව හැසිරීමද ඉතාම වැදගත් බවත් අවධාරණය කරමින් සඳහන් කිරීමට කැමැත්තෙමි.

එමෙන්ම, මෙම කරුණ පසුගිය අවුරුදු හතර තුළ සෑම විටම මතක් කිරීමට සිදුවීම සම්බන්ධයෙන් මමද කනගාටුවට පත්වෙමි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කිරීම ගැන අපි ස්තුතිවන්ත වනවා. මේ කාරණය අද උදේ පුවත් පත්වල පළ වුණා විතරක් නොවෙයි, එම පුවත් පත් වාර්තා පදනම් කර ගෙන රූපවාහිනියත් ඉතාම දැඩි ලෙස මෙම සිද්ධිය විවේචනය කළා. පාර්ලිමේන්තුවට දරන වියදම්, ගතවන කාලය පිළිබඳව ඔවුන් දැඩි විවේචනයක් කළා. මේක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි 225 දෙනාම හෑල්ලුවට ලක් කරන සිද්ධියක්.

ඒ නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. පාර්ලිමේන්තුවේ ඇමතිවරු ඉන්නවා, කැබිනට් නොවන ඇමතිවරු ඉන්නවා, රාජ්‍ය ඇමතිවරු ඉන්නවා, නියෝජ්‍ය ඇමතිවරු ඉන්නවා. මේ කවුරු හෝ ඇවිල්ලා, මේ මන්ත්‍රීවරු අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. ඒක එතුමන්ලාගේ යුතුකමක්. අද ඉඳලා හෝ ඒ කටයුත්ත කරන්න. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කර කටයුතු කරන්න කියාත් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, හොඳ හැසිරීමත් ඉතා අවශ්‍යයි. ඊයෙත් මගේ වම් පැත්තේ සිටින පාර්ශ්වයෙන් අසභ්‍ය දේවල් කියැවුණා. ඒ බව මම සඳහන් කරන්න ඕනෑ. මේ කාගේත් සංවරශීලී හැසිරීම ඉතා අවශ්‍යයි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ මගීන් හෝ භාණ්ඩ සඳහා වන සියලුම පොදු ප්‍රවාහන සේවාවන් අත්‍යාවශ්‍ය මහජන සේවාවන් බවට පත් කරමින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2019 අගෝස්තු 27 දිනැති අංක 2138/10

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සහ නියම ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස්නව වැනි වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 අප්‍රේල් 23 දිනැති අංක 2120/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 මැයි 02 දිනැති අංක 2121/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 මැයි 02 දිනැති අංක 2121/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 මැයි 02 දිනැති අංක 2121/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 මැයි 10 දිනැති අංක 2122/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ix) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2019 මැයි 29 දිනැති අංක 2125/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම වාර්තා සහ නියම අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දුමින්ද දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 01 - 58/'18 - (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### 2018 තද සුළඟින් සිදු වූ හානි : කුරුණෑගල දිස්ත්‍රික්කය
### 2018 இல் கடும் காற்றினால் ஏற்பட்ட சேதம்: குருணாகல் மாவட்டம்
### DAMAGES CAUSED BY STRONG WINDS IN 2018 : KURUNEGALA DISTRICT

105/'18

**2. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018 ජූනි 11හෝ ඊට ආසන්න දිනවල කුරුණෑගල දිස්ත්‍රික්කයට බලපාන ලද තද සුළං තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ නිවාස සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අවතැන් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iv) විනාශ වූ දේපළවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අදාළ දේපළ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) එම ප්‍රතිපාදන නියමිත පරිදි ලබා දී තිබේද;

(iii) හානි වූ ජීවිත වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල කොපමණද;

(v) කිසිදු වන්දියක් ලබා දී නොමැති නිවාස තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) 2018 ஆம் ஆண்டு யூன் 11 ஆம் திகதி அல்லது அதனை அண்மித்த நாட்களில் குருணாகல் மாவட்டத்தை தாக்கிய கடும் காற்று காரணமாக பாதிக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(ii ) இடம்பெயர்ந்த குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii ) உயிரிழந்தோர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv ) அழிக்கப்பட்ட சொத்துக்களின் பெறுமதி எவ்வளவென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i ) உரிய சொத்துக்களை இயல்பு நிலைக்கு கொண்டு வருவதற்கு ஒதுக்கப்பட்ட நிதி எவ்வளவென்பதையும்;

(ii ) மேற்படி நிதி உரிய முறையில் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii ) உயிரிழப்புகளுக்கு இழப்பீடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv ) ஆமெனில், மேற்படி இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(v ) எவ்வித இழப்பீடும் வழங்கப்படாத வீடுகள் உள்ளனவா என்பதையும்;

(vi ) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Livestock Development:

(a) Will he inform this House -

(i) the number of houses that were damaged by the strong winds that ravaged the Kurunegala District on or around 11th June, 2018 in respect of each Divisional Secretary's Division, separately;

(ii) the number of families that were displaced;

(iii) the number of lives lost; and

(iv) the value of the properties destroyed?

(b) Will he state -

(i) the amount of funds allocated to reconstruct the relevant properties;

(ii) whether those funds have been properly disbursed;

(iii) whether compensation has been paid in respect of lost lives;

(iv) if so, the amount paid as compensation;

(v) whether there are any houses for which compensation has not been paid; and

(vi) if so, the reason for that?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නිවාස සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | පූර්ණ | අර්ධ |
| 1 | කුරුණෑගල | _ | 4 |
| 2 | නිකවැරටිය | | 1 |
| 3 | මාස්පොත | 5 | 121 |
| 4 | වීරඹුගෙදර | | 1 |
| 5 | රස්නායකපුර | | 2 |
| 6 | ඉබ්බාගමුව | | 4 |
| 7 | ගනේවත්ත | | 6 |
| 8 | වාරියපොල | 4 | 104 |
| 9 | පඩුවස්නුවර/බ | | 3 |
| 10 | අලව්ව | 1 | 13 |
| 11 | උඩුබද්දාව | | 103 |
| 12 | කොබෙයිගනේ | | 3 |
| | එකතුව | 10 | 365 |

(ii) පවුල් 377.

(iii) නැත.

(iv) රුපියල් 33,196,379.71

(ආ) (i) මූලික අත්තිකාරම් වශයෙන් රුපියල් 10,000 බැගින් රුපියල් 3,750,000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

තවද, රුපියල් 25,000ට වැඩි හානි තක්සේරු වටිනාකම් සහිත අයදුම්පත් 287ක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කර ඇති අතර, මේ වන විට ප්‍රතිලාභීන් 242 දෙනකු සඳහා වන්දි ලෙස රුපියල් 14,531,835.00ක් ගෙවා ඇත.

(ii) ඔව්.

ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලැබුණු රුපියල් 25,000ට වැඩි හානි තක්සේරු වටිනාකම් සහිත අයදුම්පත් 45ක් සඳහා ඡායාරූප නොමැති වීම, අයිතිය තහවුරු නොවීම, ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොමැති වීම යන හේතු නිසා වන්දි ගෙවීම ප්‍රමාද වී ඇත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, 2018 ජූනි මාසයේ ඇති වුණු සුළිසුළං තත්ත්වයත් සමඟ ලංකාවේ දිස්ත්‍රික්ක 19ක නිවාස විශාල සංඛ්‍යාවක් විනාශ වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ඔබතුමා කිව්වා, විවිධ තොරතුරු නොලැබීම තුළ ගෙවීම් ප්‍රමාද වෙලා තිබෙනවා කියලා. මට දැන් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි ගරු කථානායකතුමනි, උඩුබද්දාව වාගේ ප්‍රදේශවලත් නිවාස විශාල ප්‍රමාණයක් වහළ පිටින් ගසාගෙන ගියා. හැබැයි, එක පොඩි හේතුවක් මත සහ අනෙකුත් හේතු මත නිලධාරින් තවමත් ඒවාට වන්දියක් ගෙවලා නැහැ. ඇත්තටම ඒ අයගේ නිවස කඩාගෙන වැටුණාම, අඩුම තරමින් ඒ සඳහා ලබා දෙන රක්ෂණ වන්දියෙන් සත පහක්වත් නොලැබුණු තැන් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒ අයට අසාධාරණයක් වෙලා තිබෙනවා, හානියක් වෙලා තිබෙනවා. නමුත්, ඔවුන්ට අවශ්‍ය වන්දි මුදල් ගෙවලා නැහැ. ඔවුන්ගේ නිවාස කඩා වැටුණු බව පෙනෙන්නට තිබෙනවා. ඒ සඳහා වෙනත් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි. ඒ වන්දි මුදල් ගෙවීමේදී, "අංකයක් නැහැ" හෝ මොකක් හෝ හේතුවක් කියලා වන්දි ලබා දීම නතර කරලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධව ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණය අයදුම් පත්‍ර 45ක් සඳහා අදාළ වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒවා පොඩි පොඩි කාරණා. ඡායාරූපයක් නොමැතිවීම, අයිතිය තහවුරු නොවීම, ජාතික හැඳුනුම් පත් අංකය සඳහන් නොවීම වාගේ ප්‍රශ්න නිසා ප්‍රමාදයක් වෙලා තිබෙනවා කියලා තමයි පිළිතුරේ තිබෙන්නේ. අපි ඔබතුමාගේ ඉල්ලීම ඇමතිතුමාට යොමු කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අදම ඒ ප්‍රශ්නය යොමු කරනවා නම් හොඳයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අදත් එවැනි සාකච්ඡාවක් කැඳවලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ඒකයි මම කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන සංවිධායකතුමා වැඩක් භාර ගත්තොත්, ඒක ඒ විධියටම කෙරෙනවා. මොකද, මම එතුමාගේ වැඩ හැම දාම follow කරනවා. ඒ නිසා ඒක මට කියන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නමුත්, මම ඊළඟ දවසේ ආවේ නැත්නම්, එතුමා follow කළාට වැඩක් නැහැනේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නමුත්, එතුමා පොරොන්දුව ඉෂ්ට කරනවා. ඒක මම කියන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එතුමා පොරොන්දු ඉෂ්ට කරන ඇමතිවරයෙක්. ගයන්ත කරුණාතිලක මැතිතුමා පොරොන්දු ඉටු කරනවා. අපට ප්‍රශ්නය තිබෙන්නේ, ආපදා කළමනාකරණ ඇමතිතුමා පොරොන්දු ඉටු කරනවාද නැද්ද කියන එකයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එතුමාත් ඒ වාගේ තමයි. මම පැයක් ඇතුළත මේ කාරණය එතුමාට දැනුම් දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එහෙම නම්, ඔබතුමා දැනුම් දෙනවා නේ. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -163/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -277/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -768/'19- (1), ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -801/'19- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -867/'19- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා, එම ප්‍රශ්නයට

පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -876/'19- (1), ගරු තේනුක විදානගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අද ප්‍රශ්න අහනන්න මන්ත්‍රීවරු නැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, අලුත් ස්ථාවර නියෝග අනුව ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා දැන් තුන් වතාවකට වඩා කල් ගන්න බැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දෙවතාවක් නේ කල් ගන්න පුළුවන්?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් තුන් වතාවක් කල් ගන්න පුළුවන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමාට මා ඊයේ යොමු කරපු කරුණ ගැන ඔබතුමා විමසා බැලුවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා ඒ ගැන අපට ප්‍රකාශයක් කරනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා හිතන හැටියට ඒ අය සඳුදා වනකොට මුණ ගැහෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -877/'19- (1), ගරු විමලවීර දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -933/'19- (1), ගරු මුහම්මදු නසීර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 -978/'19- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 -1005/'19- (1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අදාළ ප්‍රශ්නයට පිළිතුර නොවුණත්, එය පදනම් කරන මූලික ලියවිල්ල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබාදීලා තිබෙනවා. මෙතැන තිබෙන්නේ දුටුගැමුණු යුගයට අයත් පුරාවිද්‍යාත්මක ස්ථානයක් සංරක්ෂණය කිරීම පිළිබඳ ඉල්ලීමක්.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ කාරණය පිළිගෙන තිබෙනවා. මම මේ ලියවිල්ල හැන්සාඩ්ගත කරන්නම්. ඔවුන් කියනවා, "උක්ත ස්ථානය පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය මූලික මැනුම් නියෝග නිකුත් කොට, ගැසට් කර, සංරක්ෂණ වැඩසටහන් දියත් කිරීමට යෝජිත බව කාරුණිකව දන්වා සිටිමි" කියලා. ඒක යවලා තිබෙන්නේ අප්‍රේල් 30වෙනි දා. ගරු කථානායකතුමනි, එහෙම තිබියදී ඇයි අමාත්‍යාංශවලින් මේ විධියට කියන්නේ, "උත්තර නැහැ, සතියක් කල් දෙන්න" කියලා. මේ උත්තර ලබා දීම සතියක් නොවෙයි මාස ගාණකින් එහාට යනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිතුරු ලබා ගැනීම ඉක්මන් කරන්න, ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට මේ ලේඛනය හැන්සාඩ්ගත කරන්නත් පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සතියකින් උත්තර දෙනවා කියලා දැනුම් දීලා තිබෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 1012/'19 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 - 1030/'19 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## කැන්දලන්ද හා ගොඩගම ගම්මාන: පොදු පහසුකම්
### கென்தலந்த மற்றும் கொடகம கிராமங்கள்: பொது வசதிகள்
KENDALANDA AND GODAGAMA VILLAGES: COMMON AMENITIES

58/'18

**1. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Hesha Withanage)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්දලන්ද හා ගොඩගම නමින් ගම්මාන තිබෙන බවත්;

(ii) එම ගම්මාන තවමත් ඉතා දුෂ්කර තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගම්මානවලට අවශ්‍ය පොදු පහසුකම් සපයා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மீகஹகிவுல பிரதேச செயலாளர் பிரிவில் கென்தலந்த மற்றும் கொடகம என்ற பெயரில் கிராமங்கள் இருக்கின்றதென்பதையும்;

(ii) அக்கிராமங்கள் இன்னமும் அதிகஷ்டமான நிலையில் இருக்கின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், அக்கிராமங்களுக்குத் தேவையான பொது வசதிகளைப் பெற்றுக் கொடுப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Is he aware that-

(i) there are villages named Kendalanda and Godagama in the Meegahakiula Divisional Secretary's Division; and

(ii) those villages are still in a very difficult condition?

(b) If so, will he inform this House of the steps that will be taken by the Ministry to provide necessary common amenities to the aforesaid villages?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැන්දලන්ද නමින් ගමක් ඇත. ගොඩගම නමින් ගමක් නොමැති අතර, ගොඩයාගම නමින් ගම්මානයක් ඇත.

(ii) කැන්දලන්ද හා ගොඩයාගම යන ගම්මාන දෙකම තරමක් දුෂ්කර ගම්මාන වේ.

(ආ) ගම්පෙරළිය වැඩසටහන යටතේ ගොඩයාගම - මීගහඅරාව යා කෙරෙන පාලමක් ඉදි කිරීමට අදාළව රුපියල් ලක්ෂ 20ක (රු.2,000,000.00) ප්‍රතිපාදන අනුමත වී ඇති අතර, අදාළ ගිවිසුම අත්සන් කර පාලම ඉදි කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය.

සමෘද්ධි වැඩසටහන් මඟින් කරදගහමඩ ග්‍රාම නිලධාරි වසම තුළ පවුල් 37ක් සඳහා සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම උදෙසා වැසිකිළි ඉදි කිරීමට යෝජිතය.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 277/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කැසිනෝ බලපත්‍ර: විස්තර
## கெஷினோ உரிமங்கள்: விபரம்
## CASINO LICENCES: DETAILS

768/'19

**5. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු සුසන්ත පුංචිනිලමේ මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே சார்பாக )
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Susantha Punchinilame)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මේ වනවිට නිකුත් කර ඇති කැසිනෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංක හා මුලින්ම බලපත්‍රය ලබාදී ඇති දිනය හෝ වර්ෂය සහ කැසිනෝ ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) මේ වනවිට ඉල්ලුම් කර ඇති නව බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் விநியோகிக்கப்பட்டுள்ள கெஷினோ உரிமங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த உரிமம் பெறுநர்களின் பெயர்கள், முகவரிகள், உரிம இலக்கங்கள் மற்றும் முதல் முறையாக உரிமம் விநியோகிக்கப்பட்ட திகதி அல்லது ஆண்டு அத்துடன் கெஷினோ வியாபாரம் கொண்டுநடத்தப்படும் இடம் யாது என்பதையும்;

(iii ) இன்றளவில் கோரப்பட்டுள்ள புதிய உரிமங் களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) the number of casino licences issued up to now;

(ii) the names of those licence holders, licence numbers and the date or the year when the licence was first issued or the place where the casino business is run; and

(iii) the number of new licences applied for, at present?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් සිදු නොකරන අතර, මෙම ව්‍යාපාරවල බදු අය කර ගැනීම සඳහා බදු සඳහා ලියාපදිංචි අංකයක් ලබා දීම සිදු කරනු ලබයි. බදු සඳහා ලියාපදිංචි කර ඇති ලිපි ගොනු සංඛ්‍යාව හතරකි.

(ii)

| | නම | බලපත්‍ර අංකය | බදු සඳහා ලිපි ගොනු අංකය | ලිපිනය | ලියාපදිංචිය ලබා දුන් දිනය |
|---|---|---|---|---|---|
| 01 | Star Dust (Pvt.) Ltd. | - | GL - 2004 | 09, 15 වන පටුමග, කොළඹ 03 | 2005.05.20 |
| 02 | Bellagio (Pvt.) Ltd. | - | GL - 2077 | 430, ආර්.ඒ. ද මැල් මාවත, කොළඹ 03 | 2000.01.03 |
| 03 | Bally's (Pvt.) Ltd. | - | GL - 2078 | 34, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 | 1996.01.03 |
| 04 | Mareena Colombo (Pvt.) Ltd. | - | GL - 2082 | 30, 14 වන පටුමග, මරීනා ඩ්‍රයිව්, කොළඹ 03 | 2013.07.31 |

(iii) මේ වන විට බදු කටයුතු සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව 02කි. 2013 අංක 19 සහ 2015 අංක 14 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත් අනුව ඔට්ටු හා සූදු බදු ව්‍යාපාර සඳහා නව ලියාපදිංචි කිරීම් සිදු කළ නොහැකි බැවින් බදු ලිපි ගොනු විවෘත කළ නොහැකිව ඇත.

(ආ) පැන නොනඟී.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය: 2018 වසරේ පුනරාවර්තන වියදම්

## தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை: 2018 க்கான மீண்டெழும் செலவினம்

## NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: RECURRENT EXPENDITURE FOR 2018

801/'19

**6. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Jayantha Samaraweera)

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ,

(i) පුනරාවර්තන වියදම;

(ii) එහි සේවක වැටුප් හා දීමනා සඳහා වැය කර ඇති මුදල;

(iii) කුලී සහ බදු පදනමින් ලබා ගත් වාහන සඳහා වැය කර ඇති මුදල;

(iv) ඉන්ධන සඳහා වැය කර ඇති මුදල;

(v) විදුලි හා ජල ගාස්තු සඳහා වැය කර ඇති මුදල;

(vi) දුරකථන ගාස්තු සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

(ආ) අධිකාරියේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් දීමනා සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2018.12.31 ஆம் திகதியன்று முடிவடைந்த வருடத்திற் கான தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகார சபையின்,

(i) மீண்டெழும் செலவினம்;

(ii) அதன் ஊழியர்களது சம்பளம் மற்றும் கொடுப்பனவுகளுக்கான செலவினம்;

(iii) வாடகை மற்றும் குத்தகை அடிப்படையில் பெறப்பட்டுள்ள வாகனங்களுக்காக செலவிடப் பட்டுள்ள பணத்தொகை;

(iv) எரிபொருளுக்காக செலவிடப்பட்டுள்ள பணத் தொகை;

(v) மின்சாரம் மற்றும் தண்ணீர் கட்டணத்திற்காக செலவிடப்பட்டுள்ள பணத்தொகை;

(vi) தொலைபேசி கட்டணத்திற்காக செலவிடப் பட்டுள்ள பணத்தொகை;

எவ்வளவென்பதை தனித்தனியாக குறிப்பிடு வாரா?

(ஆ) அதிகாரசபையின் தவிசாளரின் மற்றும் பணிப்பாளர் சபையின் சம்பளம் மற்றும் ஏனைய கொடுப்பனவு களுக்காக செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he state in relation to the National Housing Development Authority for the year ending 31.12.2018, separately-

(i) the Recurrent Expenditure;

(ii) the amount spent for the salaries and allowances of its employees;

(iii) the amount spent for the vehicles obtained on rent and on lease basis;

(iv) the amount spent for fuel;

(v) the amount spent for water and electricity charges; and

(vi) the amount spent for telephone charges?

(b) Will he inform this House of the amount spent for the salaries and other allowances of the Chairman and the Board of Directors of the Authority?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රු.මි. 3,514.434

(ii) රු.මි. 1,653.555

(iii) රු.මි. 83.968

(iv) රු.මි. 48.443

(v) විදුලිය සඳහා වැය කර ඇති මුදල රු.මි. 17.032

ජල ගාස්තු සඳහා වැය කර ඇති මුදල රු.මි. 3.785

(vi) රු.මි. 18.565

(ආ) 2018 වර්ෂය තුළ සභාපති, උප සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ වෙත ගෙවන ලද වැටුප් හා අනෙකුත් දීමනා ඇමුණුම 01 මඟින් පෙන්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ගෙවන ලද අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ඇමුණුම 02 මඟින් පෙන්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම 01

| 2018 වර්ෂය තුළ | සභාපති, උප සභාපති | හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ | වෙත ගෙවන ලද | දීමනා විස්තරය |
|---|---|---|---|---|
| තනතුර | නම | වර්ෂය තුළ මාසික දීමනා වශයෙන් | අනෙකුත් දීමනා (දුරකථන) | මුළු එකතුව (රුපියල්) |
| සභාපති | එල්.එස්. පලන්සූරිය මයා | 796,612.90 | 116,518.00 | 913,130.90 |
| උප සභාපති | කේ. අතුකෝරල මයා | 637,290.32 | 87,655.00 | 724,945.32 |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | කේ.ජී. වික්‍රම මයා | 637,290.32 | 92,505.00 | 729,795.32 |
| | එකතුව | 2,071,193.54 | 296,678.00 | 2,367,871.54 |

ඇමුණුම 02

| අනු අංකය | නම | 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා (රු) |
|---|---|---|
| 1 | එස්. ජයවර්ධන මයා | 6,000.00 |
| 2 | ආර්.ඒ. චූලානන්ද මයා | 42,000.00 |
| 3 | එන්.එම්.ඩී. නවරත්න මයා | 54,000.00 |
| 4 | ඒ.එස්. වික්‍රමතුංග මයා | 60,000.00 |
| 5 | නිලා පියසීලි ගුණසේකර මිය | 6,000.00 |
| 6 | කපිල ගමගේ මයා | 6,000.00 |
| 7 | ඩබ්.ඒ.පී. සුමිත් කුමාර මයා | 6,000.00 |
| | එකතුව | 180,000.00 |

## මහියංගණය පානීය ජල යෝජනා ක්‍රමය: වර්තමාන තත්ත්වය
## மஹியங்கனை குடிநீர் வழங்கல் திட்டம்: தற்போதைய நிலைமை
## DRINKING WATER PROJECT OF MAHIYANGANAYA: CURRENT SITUATION

876/'19

**8. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ( ගරු තේනුක විදානගමගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு தேனுக விதானகமகே சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane the Hon. Thenuka Vidanagamage)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2013 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය මැතිවරණ කොට්ඨාසයේ ආරම්භ කරන ලද පානීය ජල යෝජනා ක්‍රමයේ වත්මන් තත්ත්වය කවරේද;

(ii) එම ඒකාබද්ධ ජල ව්‍යාපෘතියේ පළමු අදියර මඟින් පානීය ජල පහසුකම් ලබා දිය යුතුව තිබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) පානීය ජලය ලබා දීමට නොහැකි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ජල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) මෙම ජල ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කිරීමේ සූදානමක් තිබේද;

(vi) එසේ නම්, ඒ පිළිබඳ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) වකුගඩු රෝගීන් විශාල සංඛ්‍යාවක් වෙසෙන මහියංගණය මැතිවරණ කොට්ඨාසයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013 ஆம் ஆண்டில் பதுளை மாவட்டத்தில், மகியங்கனை தேர்தல் தொகுதியில் ஆரம்பிக்கப் பட்ட குடிநீர் வழங்கல் திட்டம் தொடர்பான தற்போதைய நிலைமை யாதென்பதையும்;

(ii) அவ்வொன்றிணைந்த நீர் விநியோகத் திட்டத்தின் முதலாம் கட்டத்தின் மூலமாக குடிநீர் வசதிகளைப் பெற்றுகொடுக்க வேண்டியிருந்த குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) குடிநீர் வசதியைப் பெற்றுக் கொடுக்க முடியாமல் போன குடும்பங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iv) அந்நீர் விநியோகத் திட்டத்தின் தற்போதைய நிலைமை யாதென்பதையும்;

(v) இந்நீர் விநியோகத்திட்டத்தின் இரண்டாம் கட்டத்தினை ஆரம்பிக்கும் ஏற்பாடொன்று காணப்படுகின்றதா என்பதையும்;

(vi) ஆமெனில், அது தொடர்பான தற்போதைய நிலைமை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) சிறுநீரக நோயாளர்கள் அதிக எண்ணிக்கையில் வசிக்கின்ற மகியங்கனை தேர்தல் தொகுதியி லுள்ள மக்களது குடிநீர் தேவைப்பாட்டினை பூர்த்தி செய்வதற்கு அமைச்சினால் மேற்கொள்ளப் படுகின்ற நடவடிக்கைகள் யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) the current situation pertaining to the drinking water supply project launched in Mahiyangana Electorate of Badulla District in 2013;

(ii) the number of families for which the drinking water was scheduled to be provided by the first phase of the aforesaid Integrated Water Supply Project;

(iii) the number of families for which drinking water could not be supplied;

(iv) the current situation of the aforesaid water supply project;

(v) whether there is a move to launch the second phase of the aforesaid water supply project; and

(vi) if so, the current situation of the aforesaid second phase?

(b) Will he inform this House of the measures taken by the Ministry to fulfil the drinking water needs of the people of Mahiyangana Electorate, where a large number of kidney patients reside?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

* සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙම ජල සම්පාදන ක්‍රමයෙන් ලබා දී තිබූ ජල සම්බන්ධන 1950ට අමතරව, වැඩි දියුණු කළ ජල සම්පාදන ක්‍රමය මඟින් නව ජල සම්බන්ධතා 2,750ක් පමණ මෙම වසර තුනක පමණ කාලයේදී ලබා දීමට කටයුතු කර ඇත. එමෙන්ම මූලික සැලසුමට අනුව කිලෝ මීටර් 250ක් පමණ වන සම්පූර්ණ බෙදා හැරීමේ නළ පද්ධතියෙන් මේ වනතෙක් වාර්ෂිකව රජයෙන් වෙන් වූ ප්‍රතිපාදන මඟින් බෙදා හැරීමේ ජල නළ පද්ධතිය කිලෝ මීටර් 160ක් පමණ ආවරණ කලාපය තුළ එළීමට කටයුතු කොට ඇත.

(ii) ඒකාබද්ධ ජල ව්‍යාපෘතියේ පළමු අදියර මඟින් පවුල් 10,000ක් සඳහා ජල පහසුකම් ලබා දිය හැක. මේ වන තෙක් පවුල් 4,700කට පමණ ජල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. ඊට අමතරව පවුල් 2,600ක් සඳහා ජල පහසුකම් සැපයීමට අවශ්‍ය නළ එළීම මේ වන විට ආරම්භ කර ඇත.

(iii) සැලසුම් ප්‍රකාරව බෙදාහැරීමේ නළ පද්ධතිය එළා ඇති ප්‍රදේශවල ජනතාවගේ ඉල්ලුම පරිදි නව ජල සම්බන්ධතා ලබා දීම මේ වන විටත් සිදු කරයි. ආවරණ කලාපය තුළ පිහිටි එළීමට නොහැකි වූ බෙදාහැරීමේ නළද එළීම මේ වන විට ආරම්භ කර ඇත.

(iv) මහියංගණ ව්‍යාපෘතියේ විදේශීය කොන්ත්‍රාත්කරුගේ වැඩ හා මෙතෙක් වසරක් පාසා ව්‍යාපෘතිය වෙත ලැබූ දේශීය අරමුදල්වලින් නිම කරන ලද බෙදා හැරීමේ නළ පද්ධතියට අමතරව ආවරණ කලාපය තුළ එළීමට නොහැකි වූ බෙදාහැරීමේ නළ කිලෝ මීටර් 46ක් පමණ එළීම මේ වන විට අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජලසම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය -WaSSIP- මඟින් සිදු කරනු ලැබේ. මෙමඟින් නව පවුල් 1,400කට පමණ ජල සම්බන්ධතා ලබා දීමට බලාපොරොත්තු වේ.

(v) දැනට නැත.

නමුත් පළමු අදියරයෙන් ආවරණය නොවූ ප්‍රදේශවලට විකල්ප ක්‍රම (ජලසම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය -WaSSIP- මඟින් පානීය ජලය සැපයීමට කටයුතු කරනු ලැබේ.

(vi) මහියංගණ ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ආවරණය කළ නොහැකි වූ ප්‍රදේශයන් ආවරණය කළ හැකි වන පරිදි හා වකුගඩු ආශ්‍රිත රෝගීන් බහුලව වෙසෙන ප්‍රදේශවල පානීය ජලය ලබාදීම සඳහා උල්හිටිය ජල සම්පාදන ව්‍යාපෘතියෙහි සැලසුම් මේ වන විටත් අවසන් කොට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එමෙන්ම "ලොග්ගල් ඔය" නව ජල යෝජනා ක්‍රමයක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ඌව ප්‍රාදේශීය සභාය සේවා මධ්‍යස්ථාන මඟින් සිදු කෙරෙමින් පවතී.

(ආ) දැනට වකුගඩු රෝගීන් බහුලව වෙසෙන රිදීමාලියද්ද ප්‍රදේශය මහියංගණ ව්‍යාපෘතියේ ආවරණ කලාපයෙන් බැහැරව තිබුණද අමාත්‍යාංශයේ නිර්දේශය මත එම කොටසටද පානීය ජල පහසුකම් මහියංගණය ව්‍යාපෘතියෙන් ලබා දීම සඳහා අවශ්‍ය ජල ටැංකි හා ජල පොම්පාගාර ඉදි කොට ජලය ගෙන යන ප්‍රධාන ජල නළ එළීමට කටයුතු කළ අතර දැනට වකුගඩු රෝග නිවාරණ අරමුදල් මඟින් බෙදාහැරීමේ ජල නළ ද එළීමට කටයුතු කොට ඇත. ඒ අනුව දැනට කිලෝ මීටර් 18ක ප්‍රමාණයක් බෙදා හැරීමේ නළ රිදීමාලියද්ද ප්‍රදේශයේ එළා ඇත. මෙමඟින් වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයකට පිරිසිදු පානීය ජලය ලබා දීමේ පහසුකම් සැපයෙනු ඇත.

ඊට අමතරව අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක, නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය -RIDEP- මඟින් රිදීමාලියද්ද ප්‍රදේශය ආවරණ කලාපය තුළ පිහිටි අනෙකුත් බෙදාහැරීමේ නළ පද්ධතිය එළීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව රිදීමාලියද්ද ප්‍රදේශයේ පවුල් 1,200ක් පමණ ආවරණය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

(ඇ) අදාළ නොවේ.

## සේනා දළඹු උවදුරින් පීඩාවට පත් බඩඉරිඟු ගොවීන්: සහන
## படைப்புழுத் தாக்கத்தினால் பாதிக்கப்பட்ட சோளப் பயிர்ச்செய்கையாளர்கள்: நிவாரணம்
## MAIZE FARMERS AFFECTED BY FALL ARMYWORM MENACE : RELIEF

877/’19

**9. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. D.T.W. Wimalaweera Dissanayaka)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018/2019 මහ කන්නයේදී ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගා කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එයින් සේනා දළඹු වසංගතයට ගොදුරුව විනාශ වූ බඩ ඉරිඟු වගා ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම වගා විනාශයෙන් ගොවීන්ට සිදුවූ දළ අලාභය කොපමණද;

(iv) සේනා දළඹු වසංගතයට ගොදුරුව බඩ ඉරිඟු වගාව විනාශ වීමෙන් අසරණ තත්ත්වයට පත්වූ ගොවීන්ට සහන ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) 2018/2019 பெரும் போகத்தின்போது இலங்கையில் சோளம் பயிரிடப்பட்ட காணியின் அளவு யாதென்பதையும்;

(ii) அவற்றில் படைப்புழு தொற்றிற்கு உள்ளாகி அழிவடைந்த சோளப்பயிர்ச் செய்கை மேற்கொள்ளப்பட்ட காணியின் அளவு யாதென்பதையும்;

(iii ) அப்பயிர்ச் செய்கை அழிவினால் விவசாயிகளுக்கு ஏற்பட்ட அண்ணளவான நட்டம் எவ்வளவு என்பதையும்;

(iv ) படைப்புழு தொற்றுக்கு உள்ளாகி சோளப்பயிர்ச் செய்கை அழிவடைந்தமையால் பாதிப்பிற்குள்ளான விவசாயிகளுக்கு நிவாரணம் வழங்கப்படுமா என்பதையும்;

(v ) ஆமெனில், அந்நிவாரணங்கள் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the extent of maize cultivated lands in 2018/2019 Maha Season in Sri Lanka;

(ii) the extent of maize cultivated lands which were affected by Fall Armyworm menace;

(iii) the approximate loss that the farmers suffered due to the aforesaid crop damage;

(iv) whether relief will be provided to the farmers who were rendered helpless due to the damages inflicted on maize cultivations by reason of Fall Armyworm menace; and

(v) if so, aforesaid relief?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හෙක්ටයාර 88,154

(ii) හෙක්ටයාර 8,367

(iii) සිදු වූ අලාභයේ මූල්‍යමය වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 829.3 ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) ඔව්.

(v) පූර්ණ වශයෙන් වගාවට හානි වූ ගොවීන් සඳහා අක්කරයකට රුපියල් 40,000 බැගින් රුපියල් මිලියන 240ක මුදලක් වන්දි මුදල් ලෙස ලබා දී අවසන් කර ඇත.

වගාව අර්ධ වශයෙන් හානියට පත් වූ ගොවීන් සඳහා හානියේ ප්‍රතිශතයට සාපේක්ෂව වන්දි මුදල් නිකුත් කිරීමට මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 - 933/'19 - (1), ගරු මුහම්මදු නසීර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු මුහම්මදු නසීර් මහතා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගලේවල පොලිස් ස්ථානය පිහිටි ගොඩනැඟිල්ල සහ භූමිය: හිමිකරුවන්ට පැවරීම
## கலேவெல பொலிஸ் நிலையம் அமைந்துள்ள காணி மற்றும் கட்டடம்: உரிமையாளர்களிடம் ஒப்படைத்தல்
## LAND AND BUILDING HOUSING GALEWELA POLICE STATION: HANDOVER TO OWNERS

978/'19

**11. ගරු එස්.එම්. මරික්කාර් මහතා (ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார் - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. S.M. Marikkar on behalf of the Hon. Ishak Rahuman)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මධ්‍යම පළාතට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල නගරයේ පිහිටා ඇති පොලිස් ස්ථානය පවත්වා ගෙන යන්නේ දැනට වසර 40කට පමණ පෙර පොලිස් දෙපාර්තමේන්තුව විසින් කුලී පදනම මත ලබාගත් ගොඩනැඟිල්ලක බවත්;

(ii) එම ගොඩනැඟිල්ල පිහිටා ඇත්තේ ගලේවෙල, නබඩගහවත්ත, මස්ජිදුල් පලාහ් නමැති මුස්ලිම් පල්ලිය සතු ඉඩමක බවත්;

(iii) මෙම ගොඩනැඟිල්ල සහිත ඉඩම එම මුස්ලිම් පල්ලිය සතු එකම දේපළ බවත්;

(iv) එම දේපළ පල්ලිය වෙත ආපසු ලබා ගැනීමට පල්ලියේ පූජකතුමන්ලා විසින් වරින්වර පොලිස් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් එම ඉල්ලීම් ඉටු වී නොමැති බවත්;

(v) මෙයට විකල්පයක් ලෙස පොලිස් ස්ථානය ඉදි කිරිම සඳහා ගලේවෙල නගරයේ, පත්කොලගොල්ල පාරේ, අක්කර එකහමාරක ඉඩමක් වෙන්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ ඉඩමක් වෙන් කර තිබියදීත්, පොලිස් ස්ථානය එම ඉඩමේ ඉදි කිරීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර මෙම පොලිස් ස්ථානය පිහිටි භූමිය සහ ගොඩනැඟිල්ල මුස්ලිම් පල්ලියට ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய மாகாணத்துக்குரிய மாத்தளை மாவட்டத்தின் கலேவெல நகரில் அமைந்துள்ள பொலிஸ் நிலையம், சுமார் 40 ஆண்டுகளுக்கு முன்னர் பொலிஸ் திணைக்களத்தினால் வாடகை அடிப்படையில் பெறப்பட்ட கட்டட மொன்றிலே இயங்குகின்றதென்பதையும்;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(ii) மேற்படி கட்டடமானது, கலேவெல, நபடகஹ வத்த, மஸ்ஜிதுல் பலாஹ் என்ற முஸ்லிம் பள்ளிவாசலுக்கு சொந்தமான காணியிலேயே அமைந்துள்ளதென்பதையும்;

(iii) இக் கட்டடத்துடன் கூடிய காணியே மேற்படி பள்ளவாசலுக்குள்ள ஒரே சொத்து என்பதையும்;

(iv) மேற்படி சொத்தினை பள்ளவாசலுக்கு மீளப் பெறுவதற்கு பள்ளிவாசலின் சமயப் பெரியார் களினால் அவ்வப்போது பொலிஸ் திணைக் களத்திடம் கோரிக்கைகள் விடுக்கப்பட்ட போதிலும் இதுவரை அக் கோரிக்கைகள் நிறைவேற்றப்படவில்லை என்பதையும்;

(v) இதற்கான மாற்றுத்திட்டமாக பொலிஸ் நிலையத்தை அமைப்பதற்கு கலேவெல நகரில், பத்கொலகொல்ல வீதியில் ஒன்றரை ஏக்கர் காணி ஒதுக்கப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறு காணி ஒதுக்கப்பட்டுள்ள நிலையிலும், குறித்த பொலிஸ் நிலையத்தை அக் காணியில் நிர்மாணிக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற் குறிப்பிட்ட விடயம் தொடர்பாக கவனம் செலுத்தி இப் பொலிஸ் நிலையம் அமைந்துள்ள காணியையும் கட்டடத்தையும் முஸ்லிம் பள்ளிவாசலுக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்,-

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Is he aware that-

(i) the police station situated at Galewela Town in Matale District belonging to the Central Province is housed in a building obtained on rent basis by the Police Department about 40 years ago;

(ii) the said building is located on a land owned by a mosque named Masjidul Palah at Nabadagahawatta, Galewela;

(iii) the land with this building is the only property belonging to the said mosque;

(iv) though requests have been made from time to time by the Moulavis of the mosque from the Police Department seeking to reclaim the said property, such requests have not been acceded to; and

(v) one-and-a-half acre land at Pathkolagolla Road in the Galewela Town has been allocated as an alternative for the construction of the police station?

(b) Will he inform this House-

(i) as to why no action has been taken despite a land being so allocated to construct the police station on the said land; and

(ii) whether action will be taken to return the land and the building in which the police station is situated?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) පල්ලියේ දායකයින්ගේ දරුවන්ට අරාබි භාෂාව ඉගැන්වීමට පාසලක් පවත්වාගෙන යාම සඳහා ඉඩමේ මුල් අයිතිකරු වන හමීඩ් ලෙබ්බෙ හාජියාර් යන අය විසින් පරිත්‍යාගයක් වශයෙන් ඉඩමේ භාරකාරිත්වය නබඩගහවත්ත මුස්ලිම් දේවස්ථානයට පවරා ඇති බවක් දැනගැනීමට ඇත.

(iii) නැත.

මුස්ලිම් පල්ලිය වෙනත් ඉඩමක පිහිටා ඇත.

(iv) මෙම ඉඩම නැවත ලබාදෙන ලෙස පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. නමුත්, පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉඩමේ මුල් අයිතිකරුගේ පුතා වන අබ්දුල් හමීඩ් මොහොමඩ් ලෙබ්බෙ යන අය සමඟ ගිවිසුමක් අත්සන් කර, කුලී මුදල් ගෙවන ලදී. ඔහු 2018.04.30 දින මියගිය අතර, ඉන් පසුව ඔහුගේ වැඩිමහල් පුතා වන මොහොමඩ් මන්සූර් අහමඩ් රිස්වි යන අය සමඟ ගිවිසුම් අත්සන් කර කුලී මුදල් ගෙවනු ලැබේ.

(v) ඔව්.

(ආ) (i) නව පොලිස් ස්ථානය සඳහා ගොඩනැඟිලි ඉදි කිරීමට සැලසුම් සකස් කරමින් පවතී.

(ii) නව පොලිස් ස්ථානය ස්ථාපිත කළ වහාම, ගොඩනැඟිල්ල සහිත භූමිය නිදහස් කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

## රජයේ වෛද්‍ය නිලධාරින්: විස්තර
### அரச மருத்துவர்கள்: விபரம்
### GOVERNMENT MEDICAL OFFICERS: DETAILS

1012/'19

**13. ගරු බිමල් රත්නායක මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Bimal Rathnayake on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa )

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතාව වෙත ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා වර්තමානය වනවිට අවශ්‍ය වන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2019.01.01 දිනය වනවිට රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) අවශ්‍ය ඉලක්කය සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරි වර්ෂවලදී රාජ්‍ය සේවයට බඳවා ගැනීමට යෝජිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව බිහි කර ගැනීම සඳහා රජය සැලසුම් කර ඇත්තේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்களுக்கு உன்னதமான சுகாதார சேவையை வழங்குவதற்காக இன்றளவில் தேவைப்படும் மருத்துவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2019.01.01 ஆம் திகதியளவில் அரச சேவையில் ஈடுபட்டுள்ள மருத்துவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) தேவையான இலக்கினை பூர்த்தி செய்து கொள்வதற்காக எதிர்வரும் ஆண்டுகளில் அரச சேவைக்கு ஆட்சேர்க்க உத்தேசிக்கப்பட்டுள்ள மருத்துவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி மருத்துவ பட்டதாரிகளை உருவாக்குவதற்கு அரசாங்கம் எவ்வாறு திட்டமிட்டுள்ளது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the number of doctors required at present to provide an optimum health service to the public;

(ii) the number of doctors serving in the Public Service by 01.01.2019;

(iii) the proposed number of doctors to be recruited to the Public Service in the coming years to achieve the expected target; and

(iv) how the Government hopes to produce that number of medical graduates?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 22,100කි.

(ii) 20,446කි.

(iii) 2020 වර්ෂය අවසන් වන විට වෛද්‍ය නිලධාරීන් 2,106ක් බඳවා ගැනීමට නියමිතය.

(iv) රජයේ වෛද්‍ය විද්‍යාලවලින් සහ විදේශීය වෛද්‍ය විද්‍යාලවලින් උපාධිය ලබා ගත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් යොදාගෙන අවශ්‍යතා සපුරා ගනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලබන ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පලාලි ගුවන් තොටුපොළ සංවර්ධනයට අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි
### பலாலி விமான நிலைய அபிவிருத்திக்காகச் சுவீகரிக்கப்பட்ட காணிகளுக்கான இழப்பீடு
### COMPENSATION FOR LANDS ACQUIRED FOR DEVELOPMENT OF PALALY AIRPORT

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர் கௌரவ அர்ஜுன ரணதுங்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித் தமைக்கு நன்றி.

யாழ்ப்பாணம், பலாலி விமான நிலையத்தின் முதற்கட்ட அபிவிருத்திப் பணிகளை விரிவுபடுத்தும் நோக்கில் 349 ஏக்கர் பொதுமக்களின் காணிகள் 1950 - 1960ஆம் ஆண்டுக் காலப்பகுதியில் சுவீகரிக்கப்பட்டதாகவும், 716 பேர் இக்காணிகளின் உரிமையாளர்களாக இருந்துள்ள நிலையில், அவர்களில் 215 பேருக்கு மட்டுமே இழப்பீடுகள் கிடைத்துள்ளதாகவும், மேற்படி காணி உரிமையாளர்களில் பலர் தற்போது உயிருடன் இல்லாத நிலையில், அவர்களின் உரித்தானவர்கள் உரிய உறுதிப்படுத்தல்கள் இன்மையால் குறிப்பிட்ட இழப்பீடுகளைப் பெற இயலாத நிலையில் உள்ளனர் என்றும் தெரிய வருகின்றது.

மேலும், பலாலி விமான நிலையத்தின் இரண்டாம் கட்ட அபிவிருத்திப் பணிக்கென 1984ஆம் ஆண்டு 397 உரிமையாளர்களது 64 ஏக்கர் காணி சுவீகரிக்கப்பட்டதாகவும், இவர்களுக்கான இழப்பீடுகள் உறுதிப்படுத்தப்பட்டுள்ள நிலையில், இதுவரையில் அவர்களுக்கான இழப்பீடுகள் வழங்கப்படவில்லை எனவும் அறியக் கிடைத்துள்ளது.

இதனிடையே பலாலி விமான நிலையத்திற்குக் கிழக்குப் பக்கமாக இதுவரையில் இருந்துள்ள பலாலி விமான நிலைய நுழைவாயிலைத் தற்போது தையிட்டிப் பக்கமாக - அதாவது மேற்குப் பக்கமாக மாற்றும் நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டு வருவதாகக் கூறப்படுகின்றது. இவ்வாறானதொரு நிலை ஏற்பட்டால், தமது சொந்தக் காணிகளில் சுமார் 2,000 ஏக்கரையும் தாங்கள் இழக்கவேண்டிய நிலை ஏற்படும் என்றே எமது மக்கள் தெரிவிக்கின்றனர்.

இந்த நிலையில், மேற்படி விடயம் தொடர்பில் பின்வரும் கேள்விகள் எழுகின்றன.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

1. 1950 - 1960ஆம் ஆண்டுகாலப் பகுதியில் சுவீகரிக்கப்பட்ட காணிகளின் உரிமையாளர்களில் இழப்பீடுகள் வழங்கப்படாத 501 உரிமையாளர்களது உரித்தாளர்கள் இழப்பீடுகளைப் பெறுவதற்கு அதற்குரிய உறுதிப்படுத்தல்கள் இல்லாத நிலையில் இருக்கின்றமையால், இவர்கள் அந்த இழப்பீடுகளைப் பெற ஏதேனும் மாற்று ஏற்பாடுகள் மேற்கொண்டு உதவ முடியுமா?
2. 1984ஆம் ஆண்டு சுவீகரிக்கப்பட்ட 64 ஏக்கர் காணிகளின் உரிமையாளர்களான 397 பேருக்கு அதற்கான இழப்பீடுகள் எப்போது வழங்கப்படும்?
3. பலாலி விமான நிலையத்தின் நுழைவாயில் தையிட்டிப் பக்கமாக மாற்றி அமைக்கப்படவுள்ளதா?
4 அவ்வாறு மாற்றி அமைக்கப்படும் எனில், பொது மக்களின் சொந்தக் காணிகள் மேலும் சுவீகரிக்கப் படுமா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பிலான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அர்ஜுன ரணதுங்க அவர்கள் வழங்குவார் என நம்புகின்றேன்.

**ගරු අර්ජුන රණතුංග මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(i) දැනට පවතින ලේඛනවල අනුසාරයෙන් ඉඩම් හිමියන් 716ක් අතුරින් ඉඩම් හිමියන් 215දෙනෙකු හට වන්දි මුදල් ලබා දීම පිළිබඳ සාක්ෂි පවතී. අනෙකුත් හිමිකරුවන් 501 දෙනෙකුට වන්දි ප්‍රදානය කර ඇත්ද, නැද්ද යන වග සනාථ කිරීම සඳහා සාක්ෂි නොමැතිව පවතී. ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත් විය හැකි පරිදි අයිතිය සනාථ කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කළ හැකි නම් වන්දි මුදල් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කළ හැක.

(ii) ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වී නොමැති බැවින් අදාළ ක්‍රියාවලිය අවසන් වූ පසු ඉඩම් හිමියන්ට වන්දි මුදල් ලබා දිය හැකිය.

(iii) ඔව්.

(iv) මෙම ඉඩම් 1987 වර්ෂයට අයත් වකවානුව තුළ පලාලි ගුවන් තොටු පොළ පුළුල් කිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම්, මෙම ඉඩම් තුළ අන්තර්ගත වී ඇත.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! ஏற்கெனவே இருந்த வாசலை மாற்றியமைப்பதற்கான நோக்கம் என்னவென்று விளங்கவில்லை. ஆனால், ஏற்கெனவே இருக்கக்கூடிய பாதை வசதியான பாதை; வாய்ப்பான பாதை. அது தொடர்பான விபரங்களை நான் தங்களுக்குப் படங்களோடு அனுப்பி வைத்திருக்கின்றேன். எல்லாப் பக்கங்களிலும் இருந்து மக்கள் சென்றடையக்கூடியமாதிரியான வசதியுடன் அப்பாதை இருக்கின்றது. புதிய பாதைக்கூடாக மக்கள் செல்வதாக இருந்தால் பல மைல்கள் சுற்றித்தான் போகவேண்டியிருக்கும். வயாவிளான் மக்கள் அதற்கான கடுமையான எதிர்ப்புக்களைத் தெரிவித்திருக்கின்றார்கள். தங்களைச் சந்திப்பதற்கு ஒரு வாய்ப்பையும் ஏற்படுத்தித் தருமாறும் கேட்டிருக்கின்றார்கள். ஏற்கெனவே நான் சொன்னதுபோல குறித்த 64 ஏக்கர் காணி சுவீகரிக்கப்பட்டமை தொடர்பான நஷ்டஈடு வழங்குவதையும் விரைவுபடுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, வவுனியா இ.போ.ச நிலையத்திற்குரிய பாதுகாப்புத் தொடர்பாகக் கடந்த தடவை உங்களிடம் கேள்வி கேட்டிருந்தேன். இலங்கை பூராவும் உள்ள ஏனைய இடங்களில் அந்தப் பாதுகாப்பு எல்லாம் அப்புறப்படுத்தப்பட்டுள்ள நிலையில், வவுனியாவைச் சேர்ந்த இ.போ.ச. நிலையத்திற்கு மாத்திரம் ஏன் விசேடமான பாதுகாப்பு? அதனால் அங்கிருக்கின்ற மக்கள் மிகுந்த அசௌகரியத்திற்கு உள்ளாகியிருக்கின்றார்கள்.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඇහුවා පිවිසීම ගැන. දැනට පිවිසීම තිබෙන්නේ ගුවන් හමුදාව පැත්තේ ඉඳලායි. අපි මේ ගුවන් තොටුපොළවල් අලුතින් හදනකොට, සිවිල් පැත්ත වෙනත් පැත්තකටත්, හමුදාව වෙනත් පැත්තකටත් තියලා තමයි හදන්නේ කියලා තීරණයක් අරගෙන තිබෙනවා. ඒක ජාත්‍යන්තර ගුවන් සේවාවේ අත්‍යවශ්‍යතාවක්. ඒ නිසා තමයි බටහිර පැත්තට වෙන්න අලුත් මාර්ගය හදලා තිබෙන්නේ. අපි අපේ දේශපාලන නායකත්වයත්, උතුරේ දේශපාලන නායකත්වයත් එක්ක පලාලි ගිහිල්ලා ඒ ඉඩම් ගැන හොයා බලා තිබෙනවා. ඒ තිබෙන අඩුපාඩු ගැන අපි දිසාපතිතුමාත්, ඉඩම් භාර නිලධාරි මහත්මයාත් එක්ක ඊයේ සාකච්ඡා කළා. සමහර ඒවායේ අයිතිය තහවුරු කරන්න පුළුවන් කරුණු දැනට නැහැ. ඒ කරුණු අපට ලබා දුන්නොත් ඒවාට ගෙවීම් කරන්න පුළුවන්. මොකද, අපි මේ වෙනකොටත් බලන්නේ පුළුවන් තරම් අඩුවෙන් අවශ්‍ය ඉඩම් ලබා ගන්නයි. ප්‍රධාන වශයෙන්ම උතුරේ ඉන්න මහජනතාවට විශාල සේවයක් සපයන්න පුළුවන් නිසා තමයි පසුගිය කාලයේ අපි ගුවන් තොටුපොළක් ආරම්භ කළේ. පසුගිය මාස 6 පුරා ඉතාම වේගයෙන් අපි මෙම ගුවන් තොටුපොළ හදා ගෙන ආවා. අපි මේ ගුවන් තොටුපොළේ කටයුතු ඔක්තෝබර් මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම තමුන්නාන්සේත් දන්නවා ඇති, උතුරේ ඉන්න ජනතාව ගුවන් ගමන් යන්න කටුනායකට එන්න ඕනෑ බව. විශේෂයෙන්ම මේ නිසා දකුණු ඉන්දියාවට යෑම සඳහා අවශ්‍ය පහසුකම ඒ ගොල්ලන්ට ලැබෙනවා. එතකොට ඒ අයගේ කාලයත් ඉතුරු වෙනවා, වියදමත් අඩු වෙනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

பலாலி விமான நிலையம் அபிவிருத்தி செய்யப்பட வேண்டும். நீங்கள் சொன்னதுபோல, அங்கிருந்து தென்னிந்தியாவிற்கு இலகுவாகப் பயணம் செய்யக்கூடியதாக இருக்கும். அந்தவகையில், நாங்கள் அதனை வரவேற்கின்றோம். ஏற்கெனவே அது நடைமுறையில் இருந்தது. பின்னர் யுத்த காரணங்களால் அது விடுபட்டுப்போய்விட்டது. ஆனால், வயாவிளான் கிராம மக்கள் அந்தப் புதிய பாதையை விரும்பவில்லை. ஆனபடியால், தயவுசெய்து நீங்கள் அவர்களுக்கு ஒரு நேரம் ஒதுக்குவீர்களேயானால், ஒன்றில் யாழ்ப்பாணத்தில் அல்லது இங்கு அவர்களை நான் அழைத்து வந்து உங்களோடு கலந்துரையாட வைக்கலாம். அப்போது நீங்கள் அவர்களுடைய கருத்துக்களையும் கேட்டறியலாம். நீங்கள் அவர்களுடைய கருத்துக்களையும் கேட்டுத் தெரிந்துகொள்வதுதான் நல்லதாக இருக்கும். வடக்குத் தலைவர்களோடு கலந்துரையாடித்தான் இதனைச் செய்ததாக நீங்கள் கூறினீர்கள்.

குறித்த வடக்குத் தலைவர் அடிக்கல் நட்டுவைத்து அதனை ஆரம்பித்து வைத்ததாக நான் கேள்விப்பட்டேன். ஆனால், தனக்கு அப்படியொன்றும் தெரியாது என்று சொல்லித் தற்போது அவர் பத்திரிகைகளுக்கு மறுப்புத் தெரிவித் திருக்கிறார்.

வவுனியா இ.போ.ச நிலையத்திற்குத் தேவையற்ற பாதுகாப்பு வழங்கியிருப்பதாக நான் நினைக்கின்றேன். இதனால் அந்த மக்கள் மிகுந்த அசௌகரியத்திற்கு உள்ளாகியிருக்கின்றார்கள். அதனையும் நீங்கள் தயவுசெய்து கருத்திலெடுக்கவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඔබතුමා කියනවා, ගුවන් තොටුපොළේ මුල්ගල තැබීමක් ගැන. ගුවන් තොටුපොළේ මුල්ගල තැබීම අපි කළේ දේශපාලන අධිකාරය නියෝජනය කරන සියලුදෙනාටම ආරාධනා කරලායි. මම කරන කිසිම දෙයකට දේශපාලනය බලපාන්නේ නැහැ. දේශපාලන අධිකාරය නියෝජනය කරන සියලුදෙනාටම මම ආරාධනා කරනවා. ඒක මගේ ප්‍රතිපත්තියක්. එතැනදී ආණ්ඩුවේද, විපක්ෂයේද කියලා බලන්නේ නැහැ. අපි ඒක කරලා තිබෙනවා, පසුගිය මාස ගණනේම. එහිදී අපි සියලුදෙනාම සම්බන්ධ වෙලා වැඩ කටයුතු කළා. ඊයේ සිද්ධ වුණේ මේකයි, ගරු මන්ත්‍රීතුමා. පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට දිසාපතිතුමා දැනුම් දීලා තිබෙනවා, ඊයේ රැස්වීම ගැන. අපි ඊයේ ගිහිල්ලා ඒ රැස්වීම පැවැත්වුවා. එයට මන්ත්‍රීවරු කීපදෙනෙක් ආවා. නමුත්, සමහර අයට එන්න බැරි වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කාලය අවශ්‍ය නම් මා ලබන සතියේ ඒකට අවස්ථාවක් ලබා දෙන්නම්. අමාත්‍යාංශයෙන් වෙලාවක් අරගෙන, අදාළ නිලධාරිතුමාත් ගෙන්වලා ඒ කටයුතු කොයි විධියටද වෙන්නේ කියලා මා ඔබතුමාට පෙන්වා දෙන්නම්.

ගරු කථානායකතුමනි, එතුමා වව්නියාවේ ඩිපෝ එක ගැනත් කිව්වා. පසු ගිය කාලයේ ඇති වූ ප්‍රශ්නයත් එක්ක අපි හුඟක් ඩිපෝවලට ආරක්ෂාව ලබා දුන්නා. ඩිපෝ කළමනාකරුට අවශ්‍යතාවක් තිබෙනවා නම් තමයි ඒ සඳහා වන ඉල්ලීම කරන්නේ. එතකොට තමයි අපි පොලීසියෙන් හෝ ආරක්ෂාව ලබා දෙන්නේ. අවශ්‍යතාවක් නැත්නම් අපි ඒ කටයුත්ත කරන්නේ නැහැ. එහෙම නැතිව, එක ඩිපෝවකට ආරක්ෂාව ලබා දෙනවා, තවත් එකකට ලබා දෙන්නේ නැහැ කියලා තීරණයක් අරගෙන නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාට එමගින් ප්‍රශ්නයක් වෙනවා නම් මා ඒ පිළිබඳව සමාව අයැදිනවා. උතුරේ විතරක් නොවෙයි, හැම තැනම ආරක්ෂාව ගැන අපි අවධානය යොමු කර තිබෙනවා. හැබැයි, ඔබතුමාට ඒ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් මා ඒ ගැන කතා කරලා ලබන සතිය ඇතුළත ඒ ප්‍රශ්නය විසඳා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Douglas Devananda, is that all right?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. Then, the Hon. (Dr.) Bandula Gunawardane.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඊයේ පැවැති විවාදය පිළිබඳව ලබා දුන් ඔබතුමාගේ නියෝගයට ගරු කරමින් පැහැදිලි කර ගැනීමක් වෙනුවෙන් මට අවසර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මක්නිසාද යත්, අපට දැන ගන්න ලැබී තිබෙන ආකාරයට, අයිතම 4ක් -1, 2, 3 සහ 4- පාර්ලිමේන්තුවේ ඊයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා මේ සභාවේ විවාද කරන බවට තමයි පක්ෂ නායක රැස්වීමේදී තීරණය ගෙන තිබෙන්නේ. ඊට පසු, ඒ පළමුවන කරුණ පමණක් ඊයේ විවාද කරන බව ගරු සභානායකතුමා සභාවට දැනුම් දීලා විවාදය පවත්වාගෙන ගියා.

ඊයේ කුරුණෑගල රැස්වීමක් පැවැත්වුණා. මුදල් ඇමතිතුමා ඒ රැස්වීමේ හිටියේත් නැහැ, මේ සභාවේ හිටියේත් නැහැ. මුදල් ඇමතිතුමා නොමැති නිසා එතුමා යටතේ තිබෙන බදු පිළිබඳ යෝජනාව ඊයේ විවාදයට ගත්තේ නැහැ. එතකොට ආණ්ඩුව දැනගෙන සිටියා, යම් කිසි ප්‍රශ්නයක් වෙලා මුදල් පිළිබඳ යෝජනාව ඡන්දයකින් පරාජය වුණොත්, අමාත්‍යවරයාට ඉල්ලා අස්වන්න සිදු වන බව. මේ සභාවේ ඒවාට උත්තර දෙන්න කෙනෙකු සිටියේත් නැහැ. අපි කැමැති වුණත්, අකැමැති වුණත් මේ කාලය තුළ එතුමන්ලාගේ පාර්ලිමේන්තු වර්ජනයක් පවතිනවා. ඡන්දය විමසන්න තිබුණේ, පස්වරු 5.30ට. එම වර්ජනයේ ප්‍රතිඵලයක් ලෙස තමයි පසුව ඡන්දය විමසන බවට සඳහන් කරමින් ඊයේ පාර්ලිමේන්තුවේ කටයුතු කල් දැම්මේ.

ගරු කථානායකතුමනි, මෙවැනි සිද්ධි පූර්වාදර්ශයක් වන නිසා, මෙවැනි අවස්ථාවක දී සභාව කොයි ආකාරයටද ක්‍රියා කළ යුත්තේ කියන එක පිළිබඳව කථානායකවරයා වශයෙන් ඔබතුමාගෙන් අපි පැහැදිලි කර ගන්න කැමැතියි. ඔබතුමා මේ ගරු සභාවට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නයට උත්තර දීලා ඉන්නම්.

ඊයේ ප්‍රධාන කටයුතු ආරම්භ කරන අවස්ථාවේදීම මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත වූ යෝජනා ගරු සභානායකතුමා අස් කර ගත්තා, අමාත්‍යවරයා නැති නිසා. මේ විවාදය යන අතරතුර මට ටෙලිෆෝන් පණිවුඩයක් ලැබුණා, මුදල් ඇමතිතුමාගෙන්. ඉතාම වැදගත් BOI ආයෝජකයන් පිරිසක් සමඟ සාකච්ඡාවක් තිබෙනවා කියලා එතුමා මට කිව්වා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කුරුණෑගල ආයෝජකයෝද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
දුරකථන ඇමතුම ආවේ මලික් සමරවික්‍රම ඇමතිතුමාගෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, දෙවන පණිවුඩය ආවේ මලික් සමරවික්‍රම ඇමතිතුමාගෙන්.

උදේ මුදල් අමාත්‍යාංශයට අදාළ විෂයයන් විවාද නොකර ඉවත් කර ගත්තා. ඊට පස්සේ විවාදය පැවැත්වෙන අවස්ථාවේ මලික් සමරවික්‍රම ඇමතිතුමා- [බාධා කිරීමක්] මට පැහැදිලි කරන්න දෙන්නේ නැහැ නේ. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. මලික් සමරවික්‍රම ඇමතිතුමා telephone කරලා මට කිව්වා, ජාතික වශයෙන් ඉතාම වැදගත් ආයෝජකයන් පිරිසක් සමඟ සාකච්ඡාවක් තිබෙන නිසා එතුමාට එන්න හම්බ වෙන්නේ නැහැ, විවාදයට කල් ගන්න අවශ්‍යයි කියලා. ඒ අවස්ථාවේ තමයි ගරු සභානායකතුමා ඒ සඳහා කල් ගත්තේ. එහෙම සාකච්ඡාවක් තිබුණු බව අද පත්තරවලත් තිබෙනවා මම දැක්කා. ඊට පස්සේ තමයි පක්ෂ නායකයන්ගේ රැස්වීම තිබුණේ. එතැනදී එක කරුණක් මතුවුණා. ඒ කරුණ සභානායකතුමා සභාවට ඉදිරිපත් කර තිබුණේ නැහැ. සභාවට ඉදිරිපත් කළා නම්, ඒක මට ඉවත් කරන්න බැහැ. නමුත්, ඉදිරිපත් කර තිබුණේ නැහැ. ඒකට පක්ෂ නායකයන්ගේ රැස්වීමේ දී සියලුදෙනාම එකඟ වුණා. ඒ නිසා මේ සිද්ධියෙන් අනාගතයට බලපෑමක් වෙන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නමුත්, ඒ ගැන විවාද කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, උදේ විවාද කළා. නමුත්, ඊයේ ගත්ත ඒ තීරණය ව්‍යවස්ථානුකූලවයි ගත්තේ. Standing Orders අනුවයි ඒ තීරණය ගත්තේ කියලා අපි ඊයේ පිළිගත්තා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, පොඩි කාරණයක් කියන්න මටත් අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මොකක්ද ඔබතුමා කියන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේ කිව්වා, මීට පෙර එවන් තීන්දු ගත් අවස්ථා තිබෙනවා කියලා. අපේ මහ ලේකම්තුමාගෙන් අපි ඉල්ලීමක් කළා, ඒ පිළිබඳව අපට වාර්තාවක් දෙන්න කියලා. මීට පෙර, මෙවන් අවස්ථාවකදී කටයුතු කළ ආකාරය පිළිබඳව අපට කරුණාකරලා වාර්තා කරන්න. එතකොට අපට මේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පූර්වාදර්ශයක් නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා. ඉන් පසුව ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්න නිසයි මා මේ ප්‍රශ්නය අහන්නේ. මේ වනවිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අලුත් සභාපතිවරයෙක් පත් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය කියන දේ මේ කාරණයට අදාළද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අහන්න පුළුවන් මේ කාරණයට අදාළ දෙයක් පමණයි. රාජ්‍ය ඇමතිතුමා කැමැති නම් පමණයි, මට අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එම ආයතනයේ සියලු වෘත්තීය සමිති දැන් එළියට බැහැලා. එතැන ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන්, මෙම පත්වීම කළ යුත්තේ ජනාධිපතිතුමා විසින්. ජනමාධ්‍ය ඇමතිතුමාටත් යම් අයිතියක් එතැන තිබෙනවා. හැබැයි, රූපවාහිනියේ sharesවලින් වැඩි කොටසක් තිබෙන්නේ මුදල් ඇමතිතුමාටයි. ගරු කථානායකතුමනි, දැනට ඉන්න සභාපතිතුමියත් අයින් කරලා, කළමනාකාර අධ්‍යක්ෂවරයාත් - Managing Directorත් - අයින් කරලා ඒ තනතුරුවලට අලුතින් අය පත් කර තිබෙනවා. මේ නිසා දැන් ජාතික සේවක සංගමයත් එළියට බැහැලා, ශ්‍රී ලංකා නිදහස්,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඒ කාරණය අදාළ වෙන්නේ ජනමාධ්‍ය ඇමතිතුමාටයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා ඒ ප්‍රශ්නය එතුමාට යොමු කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ අවස්ථාව.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. ඊයේ මම මේ කාරණය ඉදිරිපත් කළා. නමුත්, ඒ මොහොතේ ඔබතුමා හිටියේ නැහැ.

ජනමාධ්‍යවල වාර්තා වනවා, පාර්ලිමේන්තුවේ දෛනික වියදම මෙච්චරයි කියලා. ඒ නිසා දැන් ජනතාව අතරේ චිත්‍රයක් ඇඳිලා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රත්තරන් ගිලිනවාද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක අපි පැහැදිලි කරන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

පාර්ලිමේන්තුවේ සේවකයන් එක්දහස් ගණනක් ඉන්නවා. පිටින්, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවලට රාජ්‍ය නිලධාරින් හත්-අටසීයක් එනවා. ඊළඟට මාධ්‍යවේදීන් එනවා. පොලිස් නිලධාරින් ඉන්නවා. එතකොට, ඒ සියලු විය හියදම් මන්ත්‍රීවරු 225 දෙනාටද අයිති වන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මීට සති දෙකකට කලින් ඔය කාරණය අපි පැහැදිලි කර දීලා තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න පුළුවන්ද? මොකද, ඊයේ අපි කළ කථාව මාධ්‍ය මඟින් වාර්තා කළේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මාධ්‍යවල ප්‍රශ්නයක් නේ. මම මොනවා කරන්නද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඔබතුමාට පුළුවන්ද, ඒ ගැන පාර්ලිමේන්තුවට breakdown එකක් දෙන්න. එතකොට අපි ඒ ගැන කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, අපේ මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වේ, අපි 225 දෙනාටම තිබෙන ප්‍රශ්නයක් ගැන. අද අපට පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි මහා නාස්තිකාර කණ්ඩායමක් ලෙසයි මිනිසුන් හිතාගෙන ඉන්නේ. ඒ නිසා මන්ත්‍රීවරුන්ට කෑමවලට කොපමණ වියදමක් යනවාද, මන්ත්‍රීවරු වෙනුවෙන් කොච්චර දීමනාවක් දෙනවාද කියලා කරුණු සහිතව සියලු තොරතුරු ඉදිරිපත් කරන්න.

ඒ වාගේම, අනෙක් අයට කොච්චර කෑම දෙනවාද, ඒ අයගේ ගණන් හිලව් කොහොමද කියන ඒ සියලු කාරණා ගැන කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මරික්කාර් මන්ත්‍රීතුමා කියපු විධියට,- [බාධා කිරීමක්] පසුගිය මාසයේ ඉඳලා අපි ඒ විස්තර ඉදිරිපත් කර තිබෙනවා. ඒවා පුවත් පත්වල පළ වෙන්නේ නැහැ. ඒකයි, ප්‍රශ්නය.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, ඔබතුමා අපට ඒ සම්පූර්ණ වාර්තාවක් දෙන්න. අපේ කෑම එකකට රුපියල් 250ක් අය කරනවා. අපි අමුත්තන් එක්කගෙන ආවාම, රුපියල් 650 ගණනේ අපෙන් කපා ගන්නවා. හැබැයි, අනෙක් අයට එච්චර අය කරන්නේ නැහැ. සමහර අයට රුපියල් 2.50ට, 5.00ට, 7.00ටත් කන්න දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කරුණු පුවත් පත්වල පළ වෙන්නේ නැති එක ගැන මට බල කරන්න බැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
සේරම නරක නාම එන්නේ අපේ ගොඩට නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒක හොඳ නැහැ. ඒ නිසා ඔබතුමා අපට වාර්තාවක් දුන්නොත්, අපට ඒ පිළිබඳව ජනමාධ්‍යවලට කථා කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායකයන්ගේ රැස්වීමේදීත් මම ඒ ගැන කරුණු කියලා තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපි ඒ ගැන පාර්ලිමේන්තුවේ වෙනම විවාදයක් පවත්වමු.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට විශේෂ කෑම වේලක් දෙනවා කියනවා. හැබැයි, අපේ ගෙදර කෑම වේල ඊට වඩා හොඳයි. අපට මෙහේ හැම දාම දෙන්නේ එකම කෑම වේලක්; පැපොල් කෑල්ලක්. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වේ මොකක්ද?

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මම නම් කෝපි එකක් විතරයි බොන්නේ. ඒ වුණාට අපටත් ඒ චෝදනාව එනවා. මොකද, අපි රුපියල් 250ක් ගෙව්වාට, රුපියල් 250ක තරම් දෙයක්වත් අපි කන්නේ නැහැ. අනික් කාරණය මේකයි. අපි එක්ක ගෙන එන ඕනෑම කෙනෙකුට -මහ ජනතාවට- අපි රුපියල් 650ක බිලක් ගෙවලා තමයි කන්න දෙන්නේ. ඒ නිසා ඒ චෝදනාව ඉතාම අසාධාරණයි. අපි අපේ මුදල් තමයි දේශපාලනයට විශාල වශයෙන් වියදම් කරන්නේ. පාර්ලිමේන්තුවෙන් හම්බ වෙන්නේ රුපියල් ලක්ෂ දෙකහමාරක වාගේ මුදලක්. අපි මාසයකට රුපියල් ලක්ෂ 16ක, 17ක මුදලක් මිනිසුන් වෙනුවෙන් වියදම් කරනවා. ඒ නිසා අපට ඒ චෝදනාව එල්ල කරන්න බැහැ. ඒ නිසා, එම චෝදනාව නිවැරදි කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නෙත් මේ කාරණය ගැනමද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, නාස්තිය පිළිබඳව කථා කරද්දී මට මෙන්න මේ ගැනත් කියන්න හිතුණා. ඇත්තටම, අපේ මේස මත තියලා තිබෙන මේ CDs, DVDs වාගේ දේවල් ඔක්කෝම යන්නේත් wasteවලට.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒක නම් ඇත්ත තමයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කවුරුවත් මේ සංයුක්ත තැටි ප්‍රයෝජනයට ගන්නේ නැහැ. මම නම් මේකෙන් සියයට පහකවත් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. මේවා වෙනුවට අපට පොත් දෙනවා නම්, අපේ ගම් ප්‍රදේශවල පාසල්වලට හෝ ඒවා දෙන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
පුස්තකාලවලට දෙන්නත් පුළුවන්.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමේදී අපි ඒ ගැන කීප අවස්ථාවකදීම සාකච්ඡා කළා. ඒ අනුව තමයි ඔය ක්‍රමය අනුගමනය කරන්නේ. වර්තමානයේ හුඟක් අය පාවිච්චි කරන්නේ - [බාධා කිරීමක්] මම ඒ ගැන කථා කරලා බලන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හරි. නමුත්, මේවා ඔක්කෝම වියදමට එකතු වෙනවා නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඇත්ත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපේ මුළු වියදමින් මේවාට කොච්චර වියදම් වෙනවාද කියලා breakdown එකකින් ගණන් බැලුවොත්, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ලේකම්තුමාට කියන්නම්, ඊළඟ පක්ෂ නායක රැස්වීමේදී මේ කාරණය සාකච්ඡාවට ගන්න කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අපට ලබා දෙන කෑම පිළිබඳව මේ ගරු සභාවේදී කථා කළා. අපේ දරු-දැරියෝ මේ පාර්ලිමේන්තුව

නැරඹීමට එනවා. මා හිතන විධියට මන්ත්‍රීවරුන්ට කෑම ලබා දීම නැවැත්වුවොත් හොඳයි. මොකද, ඇත්තටම ඒ කෑම කන්නත් බැහැ. ඒ නිසා පාර්ලිමේන්තුව නැරඹීමට එන දරුවන්ට හෝ නරඹන්නන්ට හෝ ඒවා ලබා දෙන විධියේ වැඩ පිළිවෙළක් යොදන්න පුළුවන් නම් එය වඩාත් හොඳ දෙයක් වෙයි, ගරු කථානායකතුමනි. අපි එහෙම යෝජනාවක් කරන්න තමයි හිටියේ. මන්ත්‍රීවරුන්ට කෑම ලබා දෙන එක නවත්වන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නම් කරන්න අමාරු දෙයක්. නමුත් ඒ යෝජනාවත් මම ඉදිරිපත් කරන්නම්. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, අපට ඒකට නම් එකඟ වෙන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒක සියලුදෙනාගේම කැමැත්තෙන් කළ යුතු දෙයක්.

දැන් අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙමු.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම, මුදල් අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### මුදල් පනත් කෙටුම්පත
### நிதிச் சட்டமூலம்
### FINANCE BILL

"2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; විදේශීය වාණිජ ගනුදෙනු අය බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***
*நிதி அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*Presented by the Hon.Gayantha Karunatileka on behalf of the Minister of Finance.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වර කියැවීම කවදාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Tomorrow.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order. No, we do not agree to that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Why is that? මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පමණයි නේ, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඊයේ ඇති වූ සිද්ධිය ගැන මා නැවත කථා කරන්න යන්නේ නැහැ. ඒ ගැන මත බේදයක් ඇතිව ඔබතුමා අපට තීරණයක් ලබා දීලා තිබෙනවා. අද අපේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. හෙට ඒක විවාදයට ගන්න ඕනෑ කියලා එතුමා කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට පාර්ලිමේන්තුව නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි කියනවා, "නැහැ, විවාදයට ගන්න බැහැ" කියලා. ඔබතුමාගෙන් මම ඉල්ලන්නේ මේකයි. මේ ගරු සභාවෙන් විමසලා එය විවාදයට ගත යුතුද, නැද්ද කියලා තීන්දුවක් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න සභාවේ අවසරය ගන්න අවශ්‍ය නැහැ. ඊයේ පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී අපි එකඟ වුණා. නමුත් ඒ වෙන එකක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, මේ ඒක නොවෙයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න ගරු සභාවේ අවසරය අවශ්‍ය වන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නමුත් හෙට මේ ගැන විවාද කරන්න නම් අපේ එකඟත්වයක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට මේ පනත් කෙටුම්පත ගැන විවාද කෙරෙන්නේ නැහැ නේ. ඒ ගැන පක්ෂ නායකයන් තීරණය කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නමුත්, "tomorrow" කියලා කිව්වා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කියන්නේ, "ඉදිරියේදී වෙන දවසක" කියන එකයි. සාම්ප්‍රදායික විධියට තමයි "හෙට" කියලා කිව්වේ.

***2019 සැප්තැම්බර් 17 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*2019 செப்ரெம்பர் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Ordered to be read a Second time upon Tuesday, 17th September, 2019 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපට අයිතියක් නැද්ද? "ඒකට එකඟ නැහැ" කියලා කියන්න අපට අයිතියක් නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම කියන්න අයිතියක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමාගෙන් විමසන්න හේතුවක් නැද්ද, මෙතැන එකඟත්වයක් තිබෙනවාද, නැද්ද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී විමසන්න හේතුවක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

යෝජනා පිළිබඳ දැනුම්දීම. යෝජනා අංක 2 සහ 3.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

### I

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That the Government Business shall have precedence this day."

### II

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That the proceedings on Item No. 62 of Public Business appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of the Standing Orders 27 and 111 of the Parliament."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි එකඟ නැහැ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි එකඟ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඊයේ කරපු වැඩෙන් පස්සේ, අපි එකඟ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ස්ථාවර නියෝග යටතේ, කථානායකතුමා මීට පෙරද පාර්ලිමේන්තු සම්ප්‍රදායය අනුව සභාව එකඟ නැත්නම් සභාවේ අනුමැතිය ඉල්ලා තිබෙනවා. That is why you ask whether we agree or not. Then, we say "Aye". There has been a Ruling once or twice before by the Speaker that if there is no such agreement, to put it to Vote. So, we request you to put it to Vote to get the consent of the House. අපි එකඟ නැහැ කියන්නේ ඒකයි. Please, මේ සම්ප්‍රදායය කඩන්න නම් එපා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. මම ඒ ගැන බලන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා උත්තරීතර නිලයකට ලැස්ති වෙන කෙනෙක්. එක එක්කෙනාගේ ලණු කාලා මේ සම්ප්‍රදාය නම් කඩන්න එපා. We have a right to request the Hon. Speaker to put it to Vote. - [*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Item No. 2 සඳහා එකඟ නැත්නම් ඡන්දයක් ගන්න අවස්ථාව තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We are opposed to that and we ask you to put it to a Vote.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඒක වෙන දවසක ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. වෙන දවසක ගනිමු; we will take it up on another day.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අපට කලබලයක් නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ සඳහා ඡන්දයක් ගනිමු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අපට ඒ ගැන කලබලයක් නැහැ. අපි වෙන දවසක ඒක ගනිමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තුවේ කටයුතු, අංක 2 යෝජනාව ඉල්ලා අස්කර ගන්නවාද? Then, you withdraw it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තුවේ කටයුතු, අංක 2 යෝජනාව අස්කර ගන්නවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂය කියනවා නම්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව ඉල්ලා අස් කර ගන්නවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපට හදිසියක් නැහැ. ඊළඟ දවසේ ඒ යෝජනාවට අදාළ කරුණු විවාදයට ගන්නවා. [බාධා කිරීම්] නැහැ. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම කිව්වේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව යෝජනාවක් ගෙනාවාම, සභාව එකඟ නම් තමයි, you can proceed with it. If the "සභාව" does not agree, you put it to a Vote to get the consent of the House. අපි ඡන්දයක් ඉල්ලන්නේ අපි එකඟ නැති නිසායි. අපි එකඟ නැති නිසා තමුන්නාන්සේලා ඒ යෝජනාව සභාවේ ඡන්දයකට දමන්නේ නැහැ. ඇයි ඡන්දයකට දමන්නේ නැත්තේ? භය නිසායි. ඡන්දය තියන්න, ආණ්ඩුවට ඡන්ද නැහැ. ආණ්ඩුවේ තුන්දෙනායි මෙතැන ඉන්නේ. ඉතින්, ආණ්ඩුව කොහොමද පනතක් ගෙනෙන්නේ? ඉදිරිපත් කරන ඒවා ඉල්ලා අස්කර ගන්නවාය කියන කථාව එන්නේ පරදින නිසායි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද නැත්තේ? එහෙම නම් මේ යෝජනා අංක 2 යටතේ ඉදිරිපත් කරන නියෝග සහ නියම විවාදයට ගන්නවාද නැද්ද කියලා ඡන්දයක් ගන්න. Sir, you put it to the House for a Vote. We are asking the Hon. Speaker to put it to a Vote.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Either you withdraw it or put it to a Vote.-[*Interruption.*]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු කථානායකතුමනි, අපට මේ මොකක්වත් හදිසියේ කරන්න වුවමනා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නැත්නම්, ඡන්දයකට යන්න වෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මහජන බැංකු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින්, ඒ ගැන සාකච්ඡා කරන්න කාලය දෙන්න කියලා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉල්ලුවා. අපි ඒකට එකඟයි. අපි ලබන සතියේ ඒක කරනවා. ඒ වාගේම මේ නියම සහ නියෝග ගැනත් සාකච්ඡා කරන්න ඔබතුමන්ලාට වැඩියෙන් කාලය වුවමනා නම්, අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපට මේවාත් කල් දමන්න පුළුවන්.

මේ දෙවන යෝජනාව යටතේ තිබෙන කාරණා ඊළඟ සතියේ විවාදයට ගන්න පුළුවන්. මුදල් පනතත් අපි ඉදිරිපත් කළා විතරයි. ඔබතුමන්ලාට ඒ ගැන සාකච්ඡා කරන්න කල් දීලා ඒකත් ඉදිරියේදී විවාදයට ගන්නවා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒහෙම නම් ඉල්ලා අස් කරගන්න. එතකොට ඉවරයි. ඉල්ලා අස් කරගන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අපි මේ නියෝග සහ නියම වෙනත් දවසක ඉදිරිපත් කරනවා. එතුමන්ලාට අවශ්‍ය නැත්නම් අපට හදිසියක් නැහැ. අපි වෙන දවසක ඉදිරිපත් කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, it is okay.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
තමුන්නාන්සේලාට ඕනෑ තරම් කල් දෙන්නම්. මහජන බැංකු පනත් කෙටුම්පත ගැනත් සාකච්ඡා කරන්න තමුන්නාන්සේලා ඉල්ලීමක් කළාම, අපි කල් දුන්නා. මේකටත් අපි කල් දෙන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Either you put it to a vote or withdraw it.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපි වෙනත් දවසක ඉදිරිපත් කරන්නම්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අද ඉල්ලා අස් කරගෙන වෙනත් දවසක ඉදිරිපත් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔව්, වෙනත් දවසක ඉදිරිපත් කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වෙනත් දවසක කියලා කියන්න බැහැ. අද ඉල්ලා අස් කරගන්න ඕනෑ. ඊට පස්සේ වෙනත් දවසක ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉල්ලා අස් කරගන්න අවශ්‍ය නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි මේකට එකඟ නැහැ කියලා කිව්වා. අමාරුවේ දමන්න තව උපදෙස් දෙන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද මේ නියම සහ නියෝග විවාදයට ගන්නේ නැත්නම් වෙනත් දවසක විවාදයට ගන්න පුළුවන්. I do not think we need to put it to a Vote.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ විදියට ආණ්ඩුවක් ගෙනියන්නේ කොහොමද? මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ තුන්දෙනයි ඉන්නේ. මොකක්ද මේ වැඩේ? මේක නාඩගමක්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Item Nos. 2 and 3 are withdrawn; ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, යෝජනා අංක 2 සහ 3 ඉවත් කරගත්තා.

ඊළඟට, යෝජනා අංක 4 ගනිමු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මුදල් පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කළා. අනෙක් ඒවා වෙනත් දවසක ගෙනෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, දැන් 4වැනි යෝජනාව. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙනත් දවසක ගන්නේ කොහොමද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද withdraw කරගන්නවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වෙනත් දවසක කියන්නේ, අද නොවෙයි කියන එකනේ. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, is it a postponement?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, they are withdrawing those. They are not moving those Motions. - [*Interruption.*] Yes, you have to say that. දැන් මේ ප්‍රශ්නය ඉවර කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙතන ඉන්නේ ඔක්කෝම Royalistsලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Thomian කෙනෙකුත් ඉන්නවා. [බාධා කිරීම්] අපහාස කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Item Nos. 2 and 3 withdraw කළා. So, it is finished. දැන් තිබෙන්නේ 4වැනි යෝජනාව. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමා අපහසුතාවට පත් කරන්න නොවෙයි අපි හදන්නේ. ඔබතුමා තේරුම් ගන්න, හතර දෙනෙකුට ආණ්ඩුවක් ගෙනියන්න බැහැ කියන එක. ආණ්ඩුවේ ඇතිවෙලා තිබෙන අර්බුදය තුළ ඔබතුමාට මේ විධියට පාර්ලිමේන්තුව අරගෙන යන්න බැහැ. මේ ප්‍රශ්නය විසඳාගන්න. මේ ප්‍රශ්නය විසඳාගන්නේ නැතුව ආණ්ඩුව ගෙනියන්න බැහැ. සභාව කල් දමන්න. හතර දෙනෙක් කොහොමද ආණ්ඩු කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, we will move on to Item No. 4. - [*Interruption.*]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේ විධියට කොහොමද ආණ්ඩු කරන්නේ? මේ ප්‍රශ්නය විසඳාගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Item No. 4, ගරු මහාචාර්ය ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්න. එතුමාත් පැමිණ නැහැ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ ලේකම්වරුන් තුන්දෙනා තමයි පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නේ කියන එක දැන් බොහොම පැහැදිලියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩුව පවත්වාගෙන යන්න මැති ඇමතිවරු නැහැ. එක්කෝ ආණ්ඩුව පාර්ලිමේන්තුවෙන් අයින්වෙලා යන්න ඕනෑ. එහෙම නැත්නම් කරන්න පුළුවන් කෙනෙකුට භාර දෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල්තැබීම.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.- [*සභා ගර්භය තුළ නැත.*]

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ. භා. 11.18ට, 2019 සැප්තැම්බර් මස 17 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு.ப.11.18 மணிக்கு பாராளுமன்றம், 2019 செப்ரெம்பர் 17, செவ்வாய்க்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 11.18 a.m. until 1.00 p.m. on Tuesday, 17th September, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.